# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන)

**(113 වන අධිකාරය වූ) උඩරට විවාහ හා දික්කසාද පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2013 මාර්තු මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 පෙබරවාරි මස 26 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[228 වන පනත් කෙටුම්පත]


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

*2 වන වගන්තිය :* මේ වගන්තිය මගින් (මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (113 වන අධිකාරය වූ) උඩරට විවාහ හා දීක්කසාද පනතේ 16 වන වගන්තියේ ප්‍රාදේශීය රෙජිස්ට්‍රාර්වරයාට හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට ගාස්තු ගෙවීමේ ක්‍රමය නිශ්චිතව දැක්වීම මගින් එම වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*3 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ ගෙවීමේ ක්‍රමය නිශ්චිතව දැක්වීම මගින් එම වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*4 වන වගන්තිය :* මේ වගන්තිය මගින් 19 වන වගන්තියේ රෙජිස්ට්‍රාර්වරයාට ගෙවිය යුතු ගාස්තු ප්‍රතිශෝධනය කිරීම මගින් සහ ගෙවීමේ ක්‍රමය නිශ්චිතව දැක්වීම මගින් එම වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*5 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රාදේශීය රෙජිස්ට්‍රාර්වරයාට හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට ගාස්තු ගෙවිය යුතු බවට නියම කිරීම මගින් 24 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

# උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන)

එල්.ඩී.—ඕ. 15/2013.

**(113 වන අධිකාරය වූ) උඩරට විවාහ හා දික්කසාද පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත 2013 අංක දරන උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2013 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(113 වන අධිකාරය වූ) උඩරට විවාහ හා දික්කසාද පනතේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (113 වන අධිකාරය වූ) උඩරට විවාහ හා දික්කසාද පනතේ 16 වන වගන්තියේ (6) වන උපවගන්තියේ (ඈ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරනු ලැබේ :—

> "(ඈ) නියමිත ගාස්තුව ගෙවීමේ සාක්ෂියක් වශයෙන් අවස්ථාවෝචිත පරිදි, ප්‍රාදේශීය රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද ලදුපතක් ද ඒ සමග ඉදිරිපත් කළ යුතු ය ; සහ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (5) වන උප වගන්තියේ "ප්‍රකාශය කරන පක්ෂය විසින් සැපයිය යුතු නියමිත වටිනාකමින් යුක්ත වූ මුද්දරයක් හෝ මුද්දර එම ප්‍රකාශයට අමුණා තිබිය යුතු ය.", යන වචන වෙනුවට "ප්‍රකාශය කරන පක්ෂය විසින් ගෙවිය යුතු නියමිත ගාස්තුව ගෙවීමේ සාක්ෂියක් වශයෙන් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද ලදුපතක් එම ප්‍රකාශයට අමුණා තිබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කරනු ලැබේ :—

> "(4) දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා හෝ ප්‍රාදේශීය රෙජිස්ට්‍රාර්වරයා ඉදිරිපිට ප්‍රකාශය කරනු ලබන අවස්ථාවක දී, රුපියල් සියයක මුදලක් හෝ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වෙනත්

යම් මුදලක් ගෙවීමේ සාක්ෂියක් වශයෙන් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද ලදුපතක් ද ඒ සමග ඉදිරිපත් කල යුතු ය. එම ගාස්තු ප්‍රකාශය කරන පාර්ශවය විසින් ගෙවනු ලැබිය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (2) උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

''(2) මේ වගන්තියේ ඉහතින් ම වූ විධිවිධාන යටතේ ඉදිරිපත් කිරීමට බලය පවරා ඇති සෑම ඉල්ලුම් පත්‍රයක් සමගම නියමිත වටිනාකම ගෙවා ඇති බවට වූ සාක්ෂියක් වශයෙන් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා හෝ ප්‍රාදේශීය රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද ලදුපතක් ද ඉදිරිපත් කල යුතු ය''.

වලංගුභාවය සහ හානිපූරණය.

**6.** 2013 ජනවාරි මස 1 වන දින සිට ආරම්භව 2013 මාර්තු මස 31 වන දිනයෙන් අවසන්වන කාලය දක්වා අයකිරීම සඳහා හෝ එකතු කිරීම සඳහා මේ පනත මගින් බලය දී ඇති යම් කාර්යයක් සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ ඔහු වෙනුවෙන් නැතහොත් මේ පනත යටතේ බලය පවරන යම් තැනැත්තකු විසින් අයකරනු ලබන හෝ එකතු කරනු ලබන යම් ගාස්තු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ මේ පනත යටතේ බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු විසින් වලංගු ලෙස අය කරනු ලැබ හෝ එකතු කර ඇති ලෙස සලකනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, මේ වගන්තියේ ඉහත කී විධිවිධාන, ඉහත කී කාලසීමාව තුළ දී අයකරනු ලබන හෝ එකතු කරනු ලබන ගාස්තු සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් කරනු ලබන තීරණයකට හෝ නියෝගයකට නැතිනම් යම් අධිකරණයක විභාග වෙමින් පවත්නා නඩු කටයුතු සඳහා බල නොපෑ යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**7.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.